## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

## (Recovery Plan for Learning Loss - 2022)

(7 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නාට්‍ය හා රංග කලාව

## 7 ශ්‍රේණිය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| නිපුණතාවය | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| **7 ශ්‍රේණිය පළමු වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | |
| 1. නාට්‍ය හා රංග කලාව පිළිබඳ සිද්ධාන්ත පැහැදිළි කරයි. | 1.1 ළමයින් විසින් කරනු ලබන නාට්‍යමය ක්‍රියාකාරකම් හඳුනාගනියි. | ▪ නාට්‍යමය ලක්ෂණ යන්න හඳුන්වයි.<br>▪ සෙල්ලම් ගෙවල් වැනි ළමා ක්‍රියාකාරකම් තුළ ඇති නාට්‍යමය ලක්ෂණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>▪ නාට්‍යමය අවස්ථාවක් නිරූපණය කරයි. | ▪ පන්ති කාමර නාට්‍ය, සෙල්ලම් ගෙවල් වැනි ළමා ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීම. | 1.1 පන්ති කාමර නාට්‍ය හඳුනා ගනිමු. | 01 |
| | 1.2 නාට්‍යයක තේමාව හඳුනා ගනියි. | ▪ නාට්‍යයක තේමාව යනු කුමක්දැයි හඳුනා ගැනීම.<br>▪ විවිධ නාට්‍ය කෘතිවල තේමාවන් හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>▪ ඕනෑම කලා කෘතියක තේමාවන් අන්තර්ගත බව අවබෝධ කරගෙන කරුණු දක්වයි. | ▪ නාට්‍යයෙන් හැඟවෙන පණිවුඩය හෝ ආදර්ශය හඳුනා ගැනීම. | 1.2 නාට්‍යයක තේමාව හඳුනාගනිමු. | 01 |
| | 1.3 රංග භූමිය/වේදිකාව හඳුනා ගනියි. | ▪ රංග භූමිය යන්න හඳුන්වයි.<br>▪ රංග භූමියෙහි මූලික ලක්ෂණ විස්තර කරයි.<br>▪ විවිධ රංග භූමි වර්ග හඳුනා ගෙන නම් කරයි.<br>▪ රංග භූමියක දළ සැළැස්මක් ඇඳ දක්වයි. | ▪ රංග භූමිය සරලව හඳුනා ගැනීම. | 1.3 රංග භූමිය හඳුනාගනිමු. | 01 |
| 2. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන | 2.1 නාට්‍යෝචිත කතාන්දර තෝරා පෙළ රචනය කරයි. | ▪ පෙළ රචනය සඳහා විවිධ කතන්දරවල නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගතයුතු බව අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.<br>▪ උචිත කතා පුවතක් ඇසුරින් පෙළ රචනය කරයි. | ▪ සිසුන් දන්නා කතන්දර ඇසුරින් පෙළ රචනා කිරීම. | 2.1 පෙළ ලියන්න කතා සොයමු. රඟන්න හොඳ පෙළක් හදමු. | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| නිර්මාණකරණයෙහි යෙදෙයි. | 2.2 සිය අත්දැකීම් පාදක කරගත් අවස්ථා නිරූපණය කරයි. | ▪ සාමාන්‍ය ජීවිතයේ සිදුවීම් හා අත්දැකීම් අතර ඇති නාට්‍යෝචිත අවස්ථා තෝරා පෙළගස්වයි.<br>▪ තෝරාගත් නාට්‍යෝචිත අවස්ථා වන්ට අදාළ චරිත හඳුනාගෙන එම චරිත පාදක කොටගත් අවස්ථා නිරූපණය කරයි.<br>▪ උචිත අභිනය යොදාගෙන තෝරාගත් නාට්‍යෝචිත අවස්ථා නිරූපණය කරයි. | ▪ පරිසරය පාදකකොට සිසුන් ලබාගත් අත්දැකීම් කේවලව හා සාමූහික ලෙසින් ප්‍රති නිර්මාණය කිරීම. | 2.2 අපි රඟමු. | 02 |
| | 2.3 චරිත නිරූපණය කරයි. | ▪ විවිධ චරිත නම් කරයි.<br>▪ චරිතවල මනෝ භාවයන් ඉස්මතු වනසේ එම චරිත රඟ දක්වයි. | ▪ මනෝ භාවයන් ඉස්මතුවනසේ පුද්ගල චරිත ගැඹුරින් නිරූපණය කිරීම. | 2.3 විවිධ චරිත රඟමු. | 01 |
| 3. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.. | 3.3 චරිතවලට ගැළපෙන පරිදි කටහඬ හසුරුවමින් අදාළ ක්‍රියාකාරකම්හි යෙදෙයි. | ▪ නිවැරදි උච්චාරණය ගොඩනගා ගැනීමට අනුගමනය කළයුතු දේ හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>▪ විවිධ හැගීම් ප්‍රකාශ කිරීම සඳහා<br>▪ හඬ වෙනස් ආකාරයෙන් උච්ඡාරණය කළයුතු බව පිළිගෙන අදහස් දක්වයි. | ▪ විවිධ උච්චාරණ විධි අනුගමනය කරමින් සංවාද භාවිත නිරීම. | 3.3 විවිධ උච්චාරණ විධි හඳුනා ගනිමු. | 01 |
| | | ▪ නාට්‍ය ගීත ගායනා කරයි.<br>▪ නාටය ගීත පිළිබදව දැනුමක් ලබයි.<br>▪ නාට්‍ය ගීත වලට අදාළව රංගනය කරයි. | ▪ නාට්‍ය ගීත ගායනා කරමින් රංගනයේ යෙදිම. | 3.3.2 - නාට්‍ය ගීත ගයමින් රංගනය | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4. නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.1 ඓතිහාසික කතා හා එහි පසුබිම පිළිබඳ ව අධ්‍යයනය කරයි. | ▪ නාට්‍ය නිර්මාණ සඳහා ඉතිහාස කතා එක්රැස් කරයි.<br>▪ නම් කරන ලද ඉතිහාස කතා තේමා අනුව වර්ගීකරණය කරයි.<br>▪ ඉතිහාස කතාවලට පදනම් වූ සමාජ, සංස්කෘතික පදනම සාකච්ඡා කරයි. | ඉතිහාස කතා වර්ගීකරණය, චරිත හඳුනාගැනීම, නාට්‍යමය අවස්ථා තෝරා ගැනීම. | 4.1 ඉතිහාස කතා ඇසුරින් නාට්‍ය | 02 |
| සමස්තය | | | | | 13 |